## මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය – 2015

---

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107, 111 වගන්ති සහ 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 26 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** පැහැදිලි නොකළ වෙනස්කම්

අසම්භාව්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල සටහන් මඟින් දක්වා තිබූ ප්‍රදානලාභීන්ගෙන් ආපසු අයකර ගැනීමට තීරණය වූ ප්‍රදානයන් ශේෂය, උපලේඛන ශේෂයට වඩා රු.131,500ක් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා නියමාවලියේ 7 (9) ඡේදය | එක් ලිත් වර්ෂයකට යටත් පිරිසයෙන් දෙවතාවක් වත් රීජන්ට්ස් කවුන්සිලය රැස්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රීජන්ට්ස් කවුන්සිලය එක් වතාවක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (2) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීම හුදෙක් මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සීමාවිය යුතු වුවද මධ්‍යස්ථානය විසින් මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කළ අවස්ථා 16ක් නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. |

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.252,845ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.100,511 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.152,334ක වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික රු.2,014,577කින් වැඩිවුවද පුනරාවර්තන ප්‍රදාන රු.2,312,000කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල සැසඳීමේදී 2011 වර්ෂයේදී පැවති රු.149,080ක ඌනතාවය 2012 වර්ෂයේ සිට ලාභයක් බවට පත්වී එය ක්‍රමිකව වර්ධනය වෙමින් සමාලෝචිත

වර්ෂය වනවිට රු.**252,845**ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී මධ්‍යස්ථානයේ සමස්ත දායකත්වය අඛණ්ඩව වර්ධනය වී ඇති අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.**13,796,859**ක් විය.

**3.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මධ්‍යස්ථානයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය **1:1**ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී ජංගම අනුපාතය සියයට **17** කින් හා ක්ෂණික අනුපාතය සියයට **16** කින් අඩු වී තිබුණි. වර්ෂය තුල මූල්‍ය ප්‍රදානයන් ප්‍රදානලාභීන් වෙත ලබා නොදී බැදීම් ලෙස රු.**34,378,174**ක මුදල් ප්‍රමාණයක් අත රඳවා තිබීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

**4.1** කාර්ය සාධනය

------------------

ජාතික මට්ටමේ සහ විශේෂයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුළත මධ්‍යස්ථානයේ විෂය පථයට ඇතුළත් ක්ෂේත්‍රවල පර්යේෂණවලට රුකුල් දීම හා මානව සම්පත් උත්පාදනය හා වැඩිදියුණු කිරීමට දායක වීම, නව දැනුම හා පුරෝගාමී මත උකහා ගැනීමේ ජාතික සමාර්ථය ගොඩනැගීමට දායක වීම, පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ජාතික හා විදේශීය විශ්වවිද්‍යාලවල හා බාහිර විද්වතුන්ගේ හා විශේෂඥයින්ගේ මාර්ගෝපදේශකත්වය ලබාගැනීමට ඉඩ සැපයීම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු වේ.

**2015** වර්ෂය තුළ යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රදානලාභීන් **142**ක් වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් රු.**86,000,000** ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ නව ප්‍රදානලාභීන් **44**ක් සඳහා රු.**29,460,000** ක්ද දැනට උපාධි කටයුතු කරගෙන යන ප්‍රදානලාභීන්ගේ ඉතිරි වාරික ගෙවීම සඳහා රු. **54,140,000** ක්ද යොදා ගෙන තිබුණි.

එසේම මානව සම්පත් උත්පාදනය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී විෂය ක්ෂේත්‍රයට අදාල වැඩමුළු හා පාඨමාලා **25**ක් පවත්වා තිබුණි.

මධ්‍යස්ථානය විසින් **2005** වර්ෂයේ සිට **2015** වර්ෂය දක්වා ප්‍රදානලාභීන් **407** දෙනෙකු සඳහා ප්‍රදාන ලබා දී තිබුණු අතර **2010** දෙසැම්බර් **31** දිනට පෙර වාරික ලබා දුන් ප්‍රදානලාභීන් **46** දෙනෙකු **2016** මැයි මස දක්වා තම උපාධි අධ්‍යයන කටයුතු අවසන් කර නොතිබුණු අතර එම ප්‍රදානලාභීන් වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් රු. **52,581,999** ක් ලබා දී තිබුණි.

**4.2** අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

**2015** ජනවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා දර්ශනශූරි/දර්ශනපති ප්‍රදාන ලබා දීම වෙනුවෙන් මධ්‍යස්ථානය වෙත මහා භාණ්ඩාගාරයෙන් රු.**86,000,000** ක් ලැබී තිබුණු නමුත් **2015** දෙසැම්බර් **31** දිනට රු.**48,719,944** ක් පමණක් ප්‍රදාන ලෙස ගෙවීම් කර තිබුණු අතර රු.**34,571,904** ක් කැපවීම් (Commitment) ලෙස රඳවාගෙන තිබුණි. එනම් යථෝක්ත කාරණය වෙනුවෙන් ආයතනයට ලද මුදලින් සියයට **43** ක් පමණ **2015** වර්ෂය තුල ප්‍රදාන ලෙස මුදලින් ලබා නොදී ඊළඟ වර්ෂයේදී ලබා දීම සඳහා වෙන් කර තිබුණි.

**4.3 කාර්යමණ්ඩල පරිපාලනය**

**------------------------------**

**2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 12 හි 9.2 ඡේදය ප්‍රකාරව කාර්යමණ්ඩලය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබූ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.**

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**------------------------------------------**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

**---------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය, වාර්ෂික අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදී තොරතුරු මෙම මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වී නොතිබුණි.**

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව දැනටමත් ප්‍රදාන ලබා දී ඇති ප්‍රදානලාභීන් 92ක් වෙත උපාධි අධ්‍යයන කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.70,000,000 ක් ලබාදීමට සැලසුම් කර තිබූ නමුත් වර්ෂය තුළදී ප්‍රදානලාභීන් 79 ක් වෙත පමණක් රු. 54,140,000 ක ප්‍රදාන ලබා දී තිබුණි.**

**(ඇ) සමාලෝචිත වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කළ පර්යේෂකයන් සඳහා සංඛ්‍යානය (Statistic for researchers) පාඨමාලාව පවත්වා නොතිබුණි.**

**(ඈ) සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථානය සම්බන්ධ සඟරා (NCAS Journal) 02ක් ප්‍රසිද්ධ කිරීමට සැළසුම් කර තිබුණු නමුත් සඟරා 01ක් පමණක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර තිබුණි.**

**5.2 අයවැය ලේඛනමය පාලනය**

**---------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙහි අයවැයගත මූල්‍ය ප්‍රකාශන ඇතුළත් කර නොතිබුණි.**

**(ආ) අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර සියයට 23 සිට සියයට 60 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.**

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

**--------------------------------**

**2011 ජූලි 05 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදී ඇති නියෝගය අනුව නියමාවලියේ සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් බැහැර වූ වෙනත් ක්ෂේත්‍රයන්ට සම්බන්ධ ආචාර්යවරුන්ට ප්‍රදානයන් ලබාදීමට අවශ්‍ය නම් නියමාවලිය සංශෝධනය කළයුතු බව සඳහන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළද මෙම ක්‍රියාකාරකම ඇතුළත් වී තිබුණු**

නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නියමාවලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**6.** පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | |
|---|---|
| (අ) ප්‍රදාන සම්බන්ධ අභ්‍යන්තර පාලනය | සියළු ප්‍රදානලාභීන් අධ්‍යයන කටයුතු අවසන් කිරීමට පෙළඹවීම. |
| (ආ) අත්තිකාරම් පාලනය | ලබාගත් අත්තිකාරම් අප්‍රමාදව පියවීම හා අවශ්‍යතාවයට සරිලන ප්‍රමාණය නොඉක්මවන පරිදි අත්තිකාරම් ලබාදීම. |